**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**

**මැතිවරණ ප්‍රචණ්ඩත්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**

**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**

No 6/5, Layards Road, Colombo 05, **Tel:** +094-11 3010664

**Fax**: +094-11 2505228 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org


මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, ජනාධිපති නීතිඥ නලීන් අබේසේකර මහතා, සාමාජික මහාචාර්ය රත්නජීවන් හූල් මහතා සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
රාජගිරිය.

2018-01-20

<u>අවමන් සහගත ප්‍රකාශ සිදු කරමින් මැතිවරණ ක්‍රියාවලියට බාධා පැමිණිවීම හා අපේක්ෂිකාවන් අපහසුතාවයට පත් කිරීම</u>

පළාත් පාලන ඡන්ද විමසීම නිදහස් හා සාධාරණව පැවැත්වීම සඳහා ඔබතුමන් ප්‍රමුඛ මැතිවරණ කොමිෂන් සභාව ගනිමින් තිබෙන උත්සාහය පිළිබඳව පළමුව අප ආයතනයේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමු.

ඒ අතරතුර සමාජජාලා මාධ්‍ය (Social Media) භාවිත කරමින් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ වැරදි ප්‍රචාර මෙන්ම අපේක්ෂක අපේක්ෂිකාවන් අපහසුතාවයට පත් කරන ආකාරයේ අවමන් සහගත ප්‍රකාශ ද අන්තර්ජාලයට මුදාහැරීම මේ දිනවල සීඝ්‍රයෙන් සිදුවෙමින් පැවතීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ අවධානයට ලක් කිරීමට කැමැත්තෙමු.

අප මෙම ලිපියත් සමගින් ඉදිරිපත් කර ඇති වීඩියෝ පටයේ දිස්වන ආකාරයට (මැතිවරණ කොමිෂන් සභාවේ නිල විද්‍යුත් තැපැල වෙත අදාළ වීඩියෝ පටය යොමු කර ඇත). නියාස් මවුලවී නම් ආගමික පූජකවරයා ඉතා දැඩි මෙන්ම රළු වදන් භාවිත කරමින් කාන්තා දේශපාලන සහභාගීත්වය පිළිබඳව දැඩි විවේචනයක් ඉදිරිපත් කරයි.

ඊට අමතරව මෙවර පළාත් පාලන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්ව ඇති කාන්තා අපේක්ෂිකාවන් ද බලවත් අපහසුතාවයට පත් කරමින් ප්‍රකාශ නිකුත් කරනු ලබන අතර ඔහුගේ මූලික අභිප්‍රාය වන්නේ කාන්තා අපේක්ෂිකාවන් හට ඡන්දය ලබා නොදෙන ලෙස ඡන්දදායකයන්ට බල කිරීමයි. තවද මෙකී පූජකවරයාගේ බලවත් වාග් ප්‍රහාරයට ලක් ව ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කය සඳහා තරඟ වදින කාන්තා අපේක්ෂිකාවන්ය.

මෙහි පවත්නා වඩාත් භායානක තත්ත්වය වන්නේ මෙම අවමන් සහගත වාග් ප්‍රහාරය තුළින් කුල්මත් වන ඡන්දදායකයන් කාන්තා අපේක්ෂිකාවන් ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවක් ඉස්මතු වෙමින් තිබීමයි.

මෙම නියාස් මවුලවී නම් පූජකවරයා Jamiuththowheed හෙවත් thowheed Jamath නම් ආගමික නිකායේ ආගමික නායකයෙක් ලෙස කටයුතු කරන බව පවසන අතර එකී පූජකතුමන්ගේ මෙම ක්‍රියාදාමය වහා පාලනය කිරීම සඳහා කටයුතු නොකළහොත් එය සියලු අපේක්ෂකයන් හට සමබිමක් නිර්මාණය කිරීම සඳහා ඔබ කොමිෂන් සභාව ගන්නා උත්සාහය ව්‍යර්ථ වීමට ඉඩ ඇති බව ද දැක්වීමට කැමැත්තෙමු.

තවද අප ආයතනය මගින් සිදුකළ නිරීක්ෂණයේදී තහවුරු වූයේ මෙම වීඩියෝ පටය තම තමන්ගේ දේශපාලන ප්‍රචාරය සඳහා අනෙකුත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන් යොදාගැනීමේ ප්‍රවණතාවක් ද ඇති විය හැකි බවයි.

ඉහත කරුණ පිළිබඳ නිසි පියවර ගන්නා ලෙස ඔබතුමන්ගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි,

ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය

---

පිටපත් : පූජිත් ජයසුන්දර මහතා, පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය, පොලිස් මූලස්ථානය
සී.ඩී.වික්‍රමරත්න මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ)
බී.එම්.අයි.එස්.අයි.බණ්ඩාර, සහකාර මැතිවරණ කොමසාරිස්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, පුත්තලම